වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පූරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපිරූ පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකපත්වල පිටපත් සමග 2026.11.23 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / ආයතන හා සාමාන්‍ය පරිපාලන, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අයදුම්පත සහ වැඩිදුර තොරතුරු වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙබ් ඩවියෙන් (https://pgim.cmb.ac.lk) ලබා ගත හැක. නියමිත ආකෘති පත්‍රයෙන් ඉදිරිපත් කරන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ සුදුසුකම් සහ පළපුරුද්ද නහවුරු කරන සහතිකවල සහතික කළ ඡායා පිටපත් ඇතුළු අවශ්‍ය තොරතුරු නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පමා වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිදු හේතුවක් මත නැවත සලකා බලනු නොලැබේ.

01. කළමනාකරණ සහකාර (ගිණුම් තැබීම) III ශ්‍රේණිය තනතුර

සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.
   - i. සිංහල භාෂාව / දෙමළ සාහිත්‍යය
   - ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
   - iii. ගණිතය

සහ

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එක් වරකදී සමත් වී තිබීම.

පහත සුදුසුකම් සහිත අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්

සහ

(ආ) පරිගණක මෘදුකාංග යෙදවුම් භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද

★ **තනතුරට අදාළ විශේෂිත සුදුසුකම්**

- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය / තාක්ෂණ විද්‍යාලය මගින් පිරිනමනු ලබන ගිණුම්කරණ තාක්ෂණික ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් ඊට සමාන සුදුසුකමක්

හෝ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම වාණිජ විෂය ධාරාවෙන් ලබා තිබීම.

සටහන : යෝග්‍යතා

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

තෝරාගැනීම : ලිඛිත පරීක්ෂණය, ප්‍රායෝගික පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කෙරේ.

වැටුප් පරිමාණය : 2025.04.01 දින සිට 2025.01.01 දිනට මසකට රු. 49,475-17x540-58,655
[UMN 1(III)]

අධ්‍යක්ෂ,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.
2026.10.29

Gazette.lk